**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 30 දින ගුවන් හමුදාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ගුවන් හමුදාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 53,174.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 49,525.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ගුවන් හමුදාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3,648.93 ක් හෙවත් සියයට 6.86 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 33,876.50 | 32,281.40 | 1,595.10 | 4.71 |
| මූලධන | 19,298.00 | 17,244.17 | 2,053.83 | 10.64 |
| **එකතුව** | **53,174.50** | **49,525.57** | **3,648.93** | **6.86** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ගුවන් හමුදාව වෙත වෙනත් අමාත්‍යාංශ 04 ක් හා හමුදාවන් 02 ක් විසින් එකතුව රු. මිලියන 661.7 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 578.2 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 83.5 ක් හෙවත් සියයට 12.62 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ගුවන් හමුදාව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 170 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 246.3 ක ආදායමක් රැස්කර තිබුණි. එය සංශෝධිත ආදායමෙන් සියයට 44.88 ක ඉක්මවීමක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | | ඉක්මවීම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | සංශෝධිත ඇස්මේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.16 | 250.00 | 170.00 | 246.31 | 76.3 | 44.88 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ගුවන් හමුදාවට අදාළ විෂය අංක 22401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 550.00 | 412.28 | 475.00 | 519.25 | 1,000.00 | 347.99 |

**2.4** **අග්‍රිම ගිණුම**

--------------

ගුවන් හමුදාව යටතේ වූ අග්‍රිම ගිණුම් අංකය 7002/0000/00/0030/0015/000 යටතේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 224.59 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම**

----------------------

ගුවන් හමුදාව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 99.85 ක් විය. විස්තර පහත දැක්වේ.

| **පොදු තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0013/0097/000 | 91.12 |
| 6000/0000/00/0002/0065/000 | 0.56 |
| 6000/0000/00/0018/0021/000 | 8.17 |
| | -------- |
| **එකතුව** | **99.85** |
| | **====** |

**2.6** **විගණන නිරීක්ෂණය**

----------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

ගුවන් හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

## 3.2 විසර්ජන ගිණුම

-----------------

### 3.2.1 අයවැය විචලනය

------------------

සමාලෝචිත වර්ෂයට අදාළව වැය විෂයයන් 45 කට අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන් යටතේ උපයෝජනයන් කළ පසු ඉතිරිය සියයට 6 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම

-------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2016 ජුලි 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමකට අදාල ශේෂය රු.286,036 ක් වී තිබුණි. එම ශේෂය 2001 ජුලි 06 දින සිට පැවත එමින් තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

----------------------

ගුවන් හමුදාව විසින් සමාලෝචිත වර්ෂයේදී රැස් කර තිබුණු රු.12,841,000 ක මුද්දර ගාස්තු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 (1) වගන්තිය පරිදි, කාර්තුව අවසන් වී දින 15 ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 3.5 ආදායම් ගිණුම්

----------------

ගුවන් හමුදාපති ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 20.03.02.16 දරන ගුවන් යානා කුලී යන ආදායම් සංකේතයක, ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආදායම් සංකේතයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව රැස්කළ යුතුව තිබුණු ආදායම රු.මිලියන 250.00 ක් වී තිබුණි. පසුව එම ඇස්තමේන්තුව රු.මිලියන 170.00 දක්වා සංශෝධනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 246.31ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන 76.31 කින් හෙවත් සියයට 44.85 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 13.19 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව 20.03.02.16 දරන ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඈ) ගුවන් හමුදාව වෙනුවෙන් ගුවන්යානා කුලියට දීමෙන් ලැබෙන ආදායම් රැස් කිරීම සඳහා එහි උප සමාගමක් වන හෙලිටුවර්ස් ආයතනය වෙත ගුවන් හමුදාවේ ගණකාධිකාරිවරයා විසින් ගුවන්

හමුදාව භාවිතා කරන ලද්‍ද පොත් භාරදිය යුතු වුවත් එසේ නොමැතිව එම සමාගම භාවිතා කරන ලදු පොත් මගින් ආදායම් රැස්කර තිබුණි. එසේ රැස්කරන ලද ආදායම් ගුවන් හමුදා ගිණුම් අංශයට ප්‍රේෂණය කිරීමට දිගු කාලයක් ගතවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රැස් කරන ලද ආදායමෙන් රු.5,512,160 ක් රජයේ ගිණුමක් නොවන විධායක සුභ සාධක අරමුදලට බැර කර තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------

විෂය අංක 22401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.347,780,123 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගිය, මිය ගිය හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.23,703,310 ක් වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

--------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) වත්කම් පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 හා 04 ඡේද අනුව සහ 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, 2004 ජනවාරි 01 දිනට පසු මිලදී ගත් වංචල වත්කම් සම්බන්ධයෙන් ඒවායේ පිරිවැය, මිලට ගත් දිනය, විස්තරය තාක්ෂණික පිරිවිතරයන් ආදී තොරතුරු මාස 06 කට වරක් බැගින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ව තිබුණි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මීට පෙර විගණන අවස්ථාවන් කිහිපයකදීම මේ සම්බන්ධයෙන් ගුවන් හමුදාව වෙත දැනුවත් කර තිබුණු අතර ඉදිරියේදී එය ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. කෙසේ වෙතත්, වත්කම් සම්බන්ධයෙන් වූ අසම්පූර්ණ ගිණුම් තැබීම හේතුවෙන් 2016 අගෝස්තු 31 දින වන විටත් ඒ අනුව කටයුතු කිරීමට ගුවන් හමුදාව අපොහොසත් වී තිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවේ ප්‍රධාන ලෙජරයේ වත්කම් කාණ්ඩය පරිගනක වැඩසටහනේ ස්ථාවර වත්කම් ලැයිස්තුව සමඟ පරීක්ෂා කිරීම සඳහා එම වැඩසටහන විධිමත් ලෙස යාවත්කාලීන කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

ගුවන් හමුදාව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.2,078,124,158 ක් වූ අතර, ඒ පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ රු.480,582 ක් බැරකම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් මිලදී ගෙන තිබුණු ගුවන්යානා සහ අමතර කොටස් සඳහා රු. මිලියන 25,222.33 ක් ගුවන් හමුදාව විසින් ගෙවිය යුතුව තිබුණත්, එම වටිනාකම බැරකම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(iii) වැය විෂයයන් 11 කට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 444.58 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

## 3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

බැංකු ගිණුම් 6 කට අදාළව නිකුත් කර තිබුණු රු.1,363,176 ක් වටිනා චෙක්පත් 36 ක් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු අතර එම කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ගුවන් හමුදාව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගුවන් හමුදාව සතු ජීප් රථයක අමතර කොටස් 56 ක් සේවා සැපයුම් සඳහා භාරදීමට ගලවා ඉවත් කර තිබුණු අතර ඒවා නැවත සවි නොකර ජීප් රථය නැවත අළුත්වැඩියා කටයුත්තක් සඳහා පෞද්ගලික සමාගමකට 2015 ජුනි 06 දින භාරදී තිබුණි. මෙම අමතර කොටස් නොමැතිවීම හේතුවෙන් 2016 මාර්තු 31 දින වන විටත්, අලුත්වැඩියා නිමකර නොතිබුණි. ගලවා ඉවත් කළ අමතර කොටස් 56 අතුරින් අමතර කොටස් 36 ක වෙළඳපල වටිනාකම 2016 පෙබරවාරි 11 දිනට රු.330,690 ක් වූ බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වෙතත්, මෙම අමතර කොටස්වල සම්බන්ධ වැඩිදුර පරීක්ෂණ පවත්වා එහි අලාභය ගුවන් හමුදාව විසින් තක්සේරු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විධායක සුභසාධක අරමුදලින් රු.8,799,701 ක් වැය කර එම වියදම ප්‍රතිපූර්ණය කිරීමේදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගත් බිල්පත් හා අනෙකුත් ලේඛනගත තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. සුභසාධන අරමුදල විසින් නිකුත් කළ වවුචර් පමණක් ඉදිරිපත් කර තිබුණි. එම නිසා ඉහත වියදම්වල අදාළත්වය සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) යුධමය නොවන ගුවන් මෙහෙයුම් කටයුතුවල නිරත වීම ගුවන් හමුදාවේ ප්‍රධාන කාර්යක් වුවත්, උප සමාගමක් වන හෙලිටුවර්ස් පුද්ගලික සමාගම මඟින් එම මෙහෙයුම් කටයුතු සිදු කර තිබුණි. මේ හේතුවෙන් ඒ පිළිබඳ වාර්තා පිළියෙල කිරීම හා ආදායම් එකතු කිරීම සම්බන්ධයෙන් රජය විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එම සමාගම ක්‍රියා නොකිරීම,

සමාගමේ බැංකු ගිණුම් හා ලිපිලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම යන කරුණු නිසා අදාළ ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රමාණවත් විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ගුවන් හමුදා මූලස්ථානය, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් 96 ක් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල් වල මෙහෙයුම් කටයුතු සඳහා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබූ අතර ඊට අදාලව විගණන කටයුතු සඳහා ඉල්ලා සිටි තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. 2016 ජූනි 24 වන දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ඉහත අරමුදල් විගණනයට අනුකූල වන පරිදි තවදුරටත් පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳව සකස් කළ වාර්තාවක් මාසයක් ඇතුළත අදාළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට නියෝග කර තිබුණි. 2016 අගෝස්තු 31 දින වන විටත් එම නියෝගය අනුව ගුවන් හමුදාව කටයුතු කර නොතිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

ගුවන් හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෝටර් වාහන කුලියට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4, 5.4.8 සහ 6.2.2 මාර්ගෝපදේශවලට පටහැනිව එක් වාහනයකට මසකට රු.50,000 ක් බැගින් වූ කුලී මුදලකට මෝටර් වාහන 102 ක් සඳහා 2015 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු.61,150,000 ක් ගෙවා තිබුණි.

### (ආ) අධිකාරි බලය නොලත් ගනුදෙනු

ගුවන් හමුදාව විසින් හෙලිකොප්ටර් 4 ක් අලුත්වැඩියා කිරීම සඳහා ආයතන හයකින් ලංසු කැඳවා තිබුණු අතර, ඒ සඳහා ලංසු කැඳවා නොතිබුණු ආයතනයක්ද මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මුළු වටිනාකම රු.මිලියන 450 ක් ඉක්මවා තිබුණු හෙයින් එම ප්‍රසම්පාදනය අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් විසින් අනුමත කළ යුතුව තිබුණි. නමුත් එසේ සිදු නොකර, එය විභේදනය කර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර තිබුණු අතර අවම ලංසුවට වඩා රු. මිලියන 80.38 ක් වැඩියෙන් මිල ගණන් ඉදිරිපත් කළ වියට්නාමයේ සමාගමකට රු. මිලියන 30.21 ක් වටිනා නවීකරන අංශ දෙකක් ඉවත් කර ලංසුව පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව දින 90 ක සිට දින 120 ක් අතර කාලයකදි මෙම අලුත්වැඩියාව සිදුකර භාරදිය යුතුව තිබුණි. නමුත් එදිනට පෙර භාර දී නොතිබුණත්, ඒ සඳහා රු.මිලියන 11.11 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.11 පාඩු හා හානි

සිද්ධීන් 72 ක් සම්බන්ධයෙන් වර්ෂ 5 කට වඩා කාලයක සිට පැවැත එන එකතුව රු. මිලියන 27.64 ක් වූ හානි හා පාඩු අයකර ගැනීමට, කපාහැරීමට හෝ අත්හැර දැමීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2009 වර්ෂයේදී පෞද්ගලික සමාගම් දෙකකින් එකතුව රු. මිලියන 19.96 ක් වටිනා සූර්යබල වීජී පහන් 187 ක් වසර 15 ක වගකීම් කාලයකට යටත්ව මිලදී ගැනීමට 2009 මැයි මාසයේදී ගිවිසුම්වලට එළඹ තිබුණි. ඒ අනුව 2009 වර්ෂයේදී සවිකර තිබුණු වීජී පහන් සහ බැටරි අතරින් රු. මිලියන 16.02 ක් වටිනා වීජී පහන් 148 ක් සහ බැටරි 33 ක් 2015 අප්‍රේල් 20 දින වන විට ක්‍රියා විරහිත වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | **සිවිල් අංශය** | | | |
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 07 | 04 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 193 | 95 | 98 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,868 | 2,562 | 306 |
| (v) | අනෙකුත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 440 | 173 | 267 |
| | **සේවා අංශය** | | | |
| (vi) | නිලධාරීන් | 2,156 | 1,819 | 337 |
| (vii) | සෙසු නිලයන් | 35,844 | 34,555 | 1,289 |
| | **එකතුව** | **41,513** | **39,211** | **2,302** |

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අනුමත ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව 6 ක් වුවද, 04 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. මුදල් අධ්‍යක්ෂ කාර්යාලයේ කළමනාකරණ සේවයේ නිලධාරීන් 8 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එම කාර්යයන් ඉටු කිරීම සඳහා කම්කරු ශ්‍රේණියේ සේවකයින් 9 දෙනෙකු යොදවා තිබුණි.